මගේ අංකය - ජේඑස්සී/ඊජ්/ස්ථානමාරු 2024

සියලුම මහාධිකරණ විනිශ්චයකාරවරුන්,
දිසා විනිසුරුවරුන්, මහේස්ත්‍රාත්වරුන්,
ශ්‍රේෂ්ඨාධිකරණයේ රෙජිස්ට්‍රාර් හා අභියාචනාධිකරණයේ රෙජිස්ට්‍රාර්,

**උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයේ සහ අධිකරණවල සේවයේ නියුතු සංවර්ධන නිලධාරීන්ගේ සේවයේ (ගිණුම් සහකාර, වැඩසටහන් සහකාර හා සංවර්ධන නිලධාරීන්ගේ සේවයේ) වාර්ෂික ස්ථානමාරු - 2024**

අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 111 ඌ. (1) (ආ) ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව සහ 2016.08.15 දිනැති අධිකරණ සේවා කොමිෂන් සභා තීරණය පරිදි සිදු කරන ලද උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයේ සහ අධිකරණවල සේවයේ නියුතු සංවර්ධන නිලධාරී සේවයේ (ගිණුම් සහකාර, වැඩසටහන් සහකාර හා සංවර්ධන නිලධාරී) වාර්ෂික ස්ථානමාරු නියෝග මේ සමඟ අමුණා ඇති **ඇමුණුම - A** (Annexure -A) හි සඳහන් වේ.

- **උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයේ සහ අධිකරණ වල සේවයේ නියුතු සංවර්ධන නිලධාරී සේවයේ (ගිණුම් සහකාර, වැඩසටහන් සහකාර හා සංවර්ධන නිලධාරී) වාර්ෂික ස්ථානමාරු 2024 පෙබරවාරි මස 01 වෙනි දින සිට ක්‍රියාත්මක වේ.**

- **අධිකරණවල දැනට පවතින පුරප්පාඩු අවම වන පරිදි අධිකරණවල පවතින නඩු සංඛ්‍යාව සහ අනෙකුත් සේවා අවශ්‍යතාවයන් පදනම් කර ගනිමින් පවතින කාර්ය මණ්ඩලය හැකිතාක් දුරට ලබා දීමට කටයුතු කර ඇත.**

02. මෙම ස්ථාන මාරු ලබා දීමේදී අධිකරණ සේවා කොමිෂන් සභාවේ ස්ථාන මාරු උපදෙස් නියමිත පරිදි අනුගමනය කරමින් 2023.08.08 දිනැති වාර්ෂික ස්ථාන මාරු අයදුම්පත් කැඳවීමේ ලිපිය අනුව වර්තමාන සේවා ස්ථානයේ වසර 04 සම්පූර්ණ කරන ලද එක් එක් සේවාවන්ට අයත් නිලධාරීන් හට ප්‍රමුඛත්වය ලබා දී ඇත. ඒ අනුව ඔවුන් විසින් එවන ලද ස්ථාන මාරු අයදුම්පත්හි අයදුම් කර ඇති ස්ථාන තුනෙන් (03) එකක් හැකිතාක් දුරට ලබා දී ඇත. එසේ අයදුම් කර ඇති ස්ථාන තුනෙන් එකක් ප්‍රායෝගිකව ලබාදිය නොහැකි අවස්ථාවලදී පමණක් නිලධාරීන් පදිංචි ස්ථානයන්ට සාපේක්ෂව ආසන්නතම වෙනත් සේවා ස්ථානයක් ලබා දී ඇත. තවද වර්තමාන සේවා ස්ථානයේ වසර 04 සම්පූර්ණ නොවූ නමුත් විවිධ හේතු මත ස්ථාන මාරු අයදුම්පත් ඉදිරිපත් කරන ලද නිලධාරීන්ගේ අයදුම්පත් ද හැකිතාක් දුරට සළකා බලා මෙම ස්ථාන මාරු ලැයිස්තුව සකසා ඇති බව අවධාරණය කරනු ලැබේ.

03. තවද නියමිත කාල සීමාව සම්පූර්ණ කර ඇති වුව ද, ඉහත 2023.08.08 දිනැති වාර්ෂික ස්ථාන මාරු අයදුම්පත් කැඳවීමේ ලිපියේ සඳහන් උපදෙස් පරිදි අයදුම්පත් ඉදිරිපත් නොකල නිලධාරීන්ට ද සේවා අවශ්‍යතාවය මත ස්ථාන මාරු ලබා දී ඇත.

04. 2023.08.08 දිනැති වාර්ෂික ස්ථාන මාරු අයදුම්පත් කැඳවීමේ ලිපියේ අංක 03හි සඳහන් කළ පරිදි ***" එකම අධිකරණ සංකීර්ණයක් තුල පිහිටි සියලු අධිකරණ ස්ථාන මාරු කාර්ය සඳහා එක් ස්ථානයක් සේ සළකා කටයුතු කිරීම"*** ස්ථාන මාරු සඳහා අවම ඉල්ලුමක් පවතින පොළොන්නරුව, පුත්තලම, නුවර එළිය සහ අම්පාර යන අධිකරණ සංකීර්ණ විෂයෙහි ව්‍යතිරේඛී අවස්ථාවක් සේ සළකා කටයුතු කර ඇත.

05. 2023 වර්ෂයේ වාර්ෂික ස්ථාන මාරු ලබා දීමේදී සඳහන් කළ පරිදි අධිකරණ ලිපිකරු හා අධිකරණ පොත් බැඳුම්කරු යන තනතුරු ආශ්‍රිතව රත්නපුර හා බදුල්ල දිස්ත්‍රික්ක තුළත් අධිකරණ ලඝු ලේඛක සහ අධිකරණ යතුරු ලේඛක තනතුරු ආශ්‍රිතව දකුණු පළාත තුළත් ඇති වී ඇති සුවිශේෂී තත්ත්වයන් සළකා බලා තම පදිංචි පළාතෙන් පිටත වසර 04 කට වඩා සේවය කළ නිලධරයන්ට තම ස්ථිර පදිංචි පළාත්වලට ස්ථාන මාරු ලබා දී ඇත. එසේ ස්ථාන මාරු ලබාදීම හේතුවෙන් ඇති වන පුරප්පාඩු සහ සේවා අවශ්‍යතා සපුරාලීම සඳහා පහත සඳහන් එක් එක් සේවා ගණයට අයත්,

  - **අධිකරණ ලිපිකරු** : රත්නපුර දිස්ත්‍රික්කය තුළ ස්ථානමාරු සඳහා වැඩිම ඉල්ලුමක් පවතින රත්නපුර, බලංගොඩ සහ පැල්මඩුල්ල යන අධිකරණ සංකීර්ණවල 2023.12.31 දිනට වසර 08ක් හෝ ඊට වඩා වැඩි කාලයක් සේවය කර ඇති වයස අවුරුදු 55ට අඩු නිලධාරීන්ගෙන්

වැඩිම සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරීන් හට එම පළාතෙන් පිටත අධිකරණ වෙත ස්ථාන මාරු ලබා දී ඇත. බදුල්ල දිස්ත්‍රික්කයේ පිහිටුවීමට යෝජිත නව අධිකරණ වෙත කාර්ය මණ්ඩල ලබා දීමේ අවශ්‍යතාවය මත බදුල්ල දිස්ත්‍රික්කය තුළ ස්ථිර පදිංචිය ඇති වසර 08ක් හෝ ඊට වැඩි කාලයක් එම දිස්ත්‍රික්කය තුල අධිකරණයක හෝ අධිකරණවල සේවය කරන ලද නිලධාරීන් වෙත ස්ථාන මාරු ලබා දීමේ අවශ්‍යතාවයක් පැන නොනඟින ලදි.

- **අධිකරණ ලඝු ලේඛක** : දකුණු පළාත තුළ ස්ථානමාරු සඳහා වැඩිම ඉල්ලුමක් පවතින අධිකරණ සංකීර්ණ වන ගාල්ල, මාතර, තංගල්ල, වලස්මුල්ල හා දෙයියන්දර යන අධිකරණවල 2023.12.31 දිනට වසර 08ක් හෝ ඊට වඩා වැඩි කාලයක් සේවය කර ඇති වයස අවුරුදු 55ට අඩු නිලධාරීන්ගෙන් වැඩිම සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරීන් හට දකුණු පළාතෙන් පිට පළාත්වල අධිකරණ වෙත ස්ථානමාරු ලබා දී ඇත.

- **අධිකරණ යතුරු ලේඛක** : දකුණු පළාත තුළ 2023.12.31 දිනට වසර 08ක් හෝ ඊට වඩා වැඩි කාලයක් සේවය කර ඇති වයස අවුරුදු 55ට අඩු නිලධාරීන්ගෙන් වැඩිම සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරීන් හට සහ සේවා කාලය වසර 08 කට අඩු වුවද මුල් පත්වීම දකුණු පළාත තුළට ලද නිලධාරීන් හට දකුණු පළාතෙන් පිට පළාතක පිහිටි අධිකරණයක් වෙත ස්ථාන මාරු ලබා දී ඇත.

- **අධිකරණ පොත් බැඳුම්කරු** : රත්නපුර/බදුල්ල දිස්ත්‍රික්ක තුළ අධිකරණ සංකීර්ණවල 2023.12.31 දිනට වසර 08ක් හෝ ඊට වඩා වැඩි කාලයක් සේවය කර ඇති වයස අවුරුදු 55ට අඩු නිලධාරීන්ගෙන් වැඩිම සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරීන් හට එම පළාතෙන් පිටත අධිකරණ වෙත ස්ථාන මාරු ලබා දී ඇත.

06. ඉහත පරිදි විශේෂිත සේවා ගණ යටතේ පදිංචි පළාතෙන් පරිබාහිර පළාත් වෙත ස්ථානමාරු ලබාදීමේදී නිලධාරීන් වෙත ආසන්නම පළාත් වෙත ස්ථානමාරු ලබා දීමට හැකිතාක් දුරට කටයුතු කර ඇත.

07. අනුප්‍රාප්තිකයින් රහිතව ලබා දී ඇති ස්ථානමාරු වීම් සඳහා ඇතිවන පුරප්පාඩු සම්පූර්ණ කිරීම නව බඳවා ගැනීම් මඟින් සිදු කිරීමට කටයුතු කරන බව අවධාරණය කෙරේ.

08. තව ද එක් එක් සේවා ගණයට අයත් වාර්ෂික ස්ථාන මාරු ලද අධි ශ්‍රේණියේ නිලධාරීන් සඳහා ඔවුන්ට පහසු සේවා ස්ථාන වෙත ලබා දී ඇති අනුයුක්ත වෙනුවෙන් ගමන් වියදම් හිමිකම් නොමැති බව අවධාරණය කෙරේ.

09. ස්ථාන මාරුවීම් ලද ප්‍රසූත නිවාඩු ලබා සිටින නිලධාරිනියන් මුදා හැරීම සම්බන්ධයෙන් පහත පරිදි කටයුතු කළ යුතුය.

- වැටුප් සහිත ප්‍රසූත නිවාඩු ලබමින් සිටින නිලධාරිනියන් තව දුරටත් අඩ වැටුප් ප්‍රසූත නිවාඩු අයදුම් කරන්නේ නම්, අයදුම්පත්‍ර වර්තමාන සේවා ස්ථානයේ දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත ඉදිරිපත් කළ යුතුය.

- අඩවැටුප් ප්‍රසූත නිවාඩු ලබමින් සිටින නිලධාරිනියන් තව දුරටත් වැටුප් රහිත ප්‍රසූත නිවාඩු අයදුම් කරන්නේ නම් අයදුම්පත්‍ර වර්තමාන සේවා ස්ථානයේ දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත ඉදිරිපත් කළ යුතුය.

- අඩවැටුප් ප්‍රසූත නිවාඩු හෝ වැටුප් රහිත ප්‍රසූත නිවාඩු සම්බන්ධයෙන් වර්තමාන දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය.

ඒ අනුව ප්‍රසූත නිවාඩු මත සිටින නිලධාරිනියන් ස්ථාන මාරු නියෝග මත වර්තමාන සේවා ස්ථානයෙන් මුදා හැරිය යුත්තේ ඔවුන්ට අනුමත කරන ලද ප්‍රසූත නිවාඩු අවසන් කර වර්තමාන සේවා ස්ථානයේ සේවයට වාර්තා කිරීමෙන් අනතුරුවය.

10. දැනට සේවය කරනු ලබන ස්ථානයේ වසර හතරක (04) ක සේවා කාලයක් සම්පූර්ණ කර නොමැති නිලධාරීන්ට මෙම වාර්ෂික ස්ථානමාරු වෙනුවෙන් ගමන් වියදම් හිමිකම් ලැබෙන්නේ එම නිලධාරීන්ගේ ඉල්ලීමකින් තොරව සේවා අවශ්‍යතාවය මත අදාල ස්ථාන මාරු නියෝග කර ඇත්නම් පමණි. දැනට සේවය කරනු ලබන ස්ථානයන්හි වසර හතරක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරීන්ට ආයතන සංග්‍රහයේ විධිවිධානයන්ට යටත්ව ගමන් වියදම් සඳහා හිමිකම් ලැබේ.

11. මෙම ස්ථාන මාරු නියෝග නිලධාරීන්ගේ ඉල්ලීම් සැලකිල්ලට ගනිමින් සහ උපලේඛනගත සේවයේ කාර්ය මණ්ඩලය සහ අධිකරණවල සේවයේ නියුතු සංවර්ධන නිලධාරී කාර්යය මණ්ඩලය ඒ ඒ අධිකරණයන්හි සේවා අවශ්‍යතාවයන් මත බෙදී යන පරිදි සිදු කරනු ලැබ ඇති හෙයින් **<u>අනුප්‍රාප්තිකයන් පැමිණෙන තෙක් රඳවා නොගෙන</u>** නියමිත පරිදි නිලධාරීන් මුදා හැරීම සිදු කරනු නොලැබුවහොත් අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් සිදු කරන ලද මානව සම්පත් කළමනාකරණ සැලසුම් කිරීම ක්‍රියාත්මක නොවන හෙයින් සියලුම ස්ථාන මාරු නියෝග මත මුදා හැරීම් සිදු කළ යුතුව ඇත. මෙම ස්ථාන මාරු නියෝග එපරිද්දෙන් ක්‍රියාත්මක නොකිරීමෙන් ඇති විය හැකි අයහපත් ප්‍රතිඵල පිළිබඳ වගකීම ස්ථාන මාරු නියෝග ක්‍රියාත්මක කිරීම සිදු කළ යුතුව තිබූ දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත පැවරෙන බව මෙයින් අවධාරණය කෙරේ. මේ සම්බන්ධයෙන් අධිකරණ සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 27 කෙරෙහි ඔබගේ අවධානය යොමු කරනු ලැබේ.

12. තවද නඩු භාණ්ඩ භාරකරුවන් වශයෙන් ක්‍රියා කරන නිලධාරීන් ස්ථාන මාරුවී යාමට ප්‍රථම අවසන් කළ යුතු කටයුතු නොපමාව අවසන් කළ යුතු බවද එම කටයුතු සඳහා ස්ථාන මාරුවීම් ක්‍රියාත්මක වීමෙන් පසු නැවත අනුයුක්ත කිරීමක් සිදු නොකරන බවද කොමිෂන් සභාවේ නියමය පරිදි දැනුම් දෙනු ලැබේ. එවැනි නිලධාරීන් ද ඉහත 11 ඡේදයේ පරිදි මුදා හැරිය යුතු වේ. 2024 ඒකාබද්ධ සේවා වාර්ෂික ස්ථාන මාරු යටතේ දැනටමත් ස්ථාන මාරු ලද සහ අධිකරණ සේවා කොමිෂන් සභා නිර්දේශ ලබා ඇති අධිකරණවල සේවයේ නියුතු සංවර්ධන නිලධාරීන් අදාළ අනුප්‍රාප්තිකයින් ලද විගස වහාම මුදාහැරීමට දෙපාර්තමේන්තු ප්‍රධානියා පියවර ගත යුතුය. අදාල නිලධාරීන් මුදා හරිමින් නිකුත් කරන ලද ලිපියේ පිටපතක් අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත යොමු කිරීමේදී එකී ලිපියේ දකුණු පස ඉහළ කෙළවරේ ඒ ඒ නිලධාරීන්ගේ පත්වීම් ලිපියේ සඳහන් අධිකරණ සේවා කොමිෂන් සභාවේ යොමු අංකය (පෞද්ගලික ලිපි ගොනු අංකය) සඳහන් කළ යුතුය.

උදා: යොමු අංකය: EA/PF/3…. / JSC/SPO/EM.PF/01…. / CS/DOS….

13. මෙම ස්ථාන මාරු නියෝග පරිදි අධිකරණයෙන් මුදා හැරීමට නියමිත සියලුම නිලධාරීන් නියමිත දිනට මුදා හැරීමට කටයුතු කරන බවට මෙයට අමුණා ඇති ආකෘති පත්‍රය (ආකෘතිය - I) මගින් දන්වන්න.

14. ඉල්ලා ඇති අධිකරණ තුනෙන් එකකට හෝ එම අධිකරණ පිහිටි අධිකරණ සංකීර්ණයක වෙනත් අධිකරණයකට ස්ථාන මාරු ලැබී ඇති නිලධාරීන් නැවත අභියාචනා ඉදිරිපත් නොකල යුතු අතර එලෙස අභියාචනා ඉදිරිපත් කළද එම අභියාචන සළකා බලනු නොලැබේ.

15. වාර්ෂික ස්ථාන මාරු අභියාචනා අධිකරණ සේවා කොමිෂන් සභා නිල වෙබ් අඩවියේ පල කර ඇති සබැඳියෙහි (Link) ඇති ගූගල් පෝරමය (Google form) පුරවා **2023.12.08** වන දින පස්වරු **3.00 හෝ එදිනට පෙර** ඉදිරිපත් කළ යුතු අතර (දෘඩ පිටපත එවීම අවශ්‍ය නොවන බව සළකන්න) තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින් Google form හි සඳහන් කළ දත්ත පදනම් කර ගනිමින් ආකෘතිය - "අ" එක් එක් සේවා ගණ අනුව නිවැරදිව සම්පූර්ණ කර එක් ආවරණ ලිපියක් මඟින් **2023.12.12** දිනට **ප්‍රථම** ආකෘතිපත්‍ර බහාලන කවරයේ ඉහළ වම් කෙළවරෙහි **"පිරිස් පාලන අංශය - වාර්ෂික ස්ථානමාරු අභියාචනා 2024"** යනුවෙන් සඳහන් කර <u>ලේකම්, අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලය, කොළඹ - 12</u> යන ලිපිනයට එවිය යුතු ය. (වාර්ෂික ස්ථානමාරු අයදුම් කිරීමේදී අමුණා එවන ලද වෛද්‍ය වාර්තා නැවත එවීමට අවශ්‍ය නොවන අතර වාර්ෂික ස්ථානමාරු අයදුම් කිරීමෙන් පසු ලබා ගත් වෛද්‍ය වාර්තා ඇත්නම් පමණක් යොමු කිරීම ප්‍රමාණවත්ය.)

එච්.එස්.සෝමරත්න
ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව

එච්. එස්. සෝමරත්න
ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව
කොළඹ 12

2023 දෙසැම්බර් මස 01 වෙනි දින,
කොළඹ 12,
අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ දීය.

**ආකෘතිය - I**

අධිකරණයේ නම: ......................................................................................

**<u>2024 - වාර්ෂික ස්ථානමාරු ලැබූ නිලධාරීන්</u>**

1. අධිකරණ රෙජිස්ට්‍රාර්
2. අධිකරණ පවුල් උපදේශක
3. වැඩසටහන් සහකාර,ගිණුම් සහකාර, සංවර්ධන නිලධාරී සේවය
4. අධිකරණ භාෂණ පරිවර්තක
5. අධිකරණ ලිපිකරු
6. අධිකරණ ලඝු ලේඛක
7. අධිකරණ යතුරු ලේඛක
8. අධිකරණ පොත් බැඳුම්කරු

ඉහත සඳහන් නිලධාරීන් 2024.02.01 දින සිට ස්ථාන මාරු අනුව නව සේවා ස්ථානවල සේවය කිරීමට හැකි වන පරිදි මෙම අධිකරණයෙන් මුදා හරිනු ලබන බව මෙයින් දන්වමි.

පරීක්ෂා කර බලන ලදි.

රෙජිස්ට්‍රාර්ගේ නම: ............................................................................................................

..................................................................
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන හා
නිල මුද්‍රාව

............................................
දිනය

ආකෘතිය - "අ"

වාර්ෂික ස්ථානමාරු අභියාචනා - 2024

**දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින්,**
**ලේකම්,**
**අධිකරණ සේවා කොමිෂන් සභාව.**

අධිකරණයේ නම : ..............................................................

සේවාව : අධිකරණ කළමනාකරණ සේවයේ අධිකරණ ලිපිකරු/අධිකරණ භාෂණ පරිවර්තක ......
(එක් එක් සේවාවන් සඳහා වෙනම ආකෘති පුරවා එවීමට කටයුතු කරන්න.)

| අනු අංකය | නිලධාරියාගේ නම (මයා/මිය/මෙනවිය) තනතුර, ශ්‍රේණිය, මාධ්‍ය, පෞද්ගලික ලිපි ගොනු අංකය | ස්ථානමාරුව ලද සේවා ස්ථානය | නැවත අයදුම් කරන ස්ථාන අනු පිළිවෙලින්/ ස්ථානමාරු අයදුම් පතෙහි සඳහන් නොකරන ලද ස්ථානයකට ස්ථාන මාරුවක් අපේක්ෂා කරන්නේ නම්, එසේ අපේක්ෂා කරන අධිකරණ (03) | අභියාචනය ඉදිරිපත් කිරීමට හේතු (කෙටියෙන්) | නිලධාරියා/ නිලධාරිනියගේ අත්සන | දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය/ විශේෂිත කරුණු |
|---|---|---|---|---|---|---|
| 01. | එච්. ආර්. කුමුදු පෙරේරා මිය<br>අධිකරණ භාෂණ පරිවර්තක (ඉංග්‍රීසි/ සිංහල)<br>I ශ්‍රේණිය<br>EA/PF/02/0000 | මහාධිකරණය කොළඹ | 01. හෝමාගම අධිකරණ සංකීර්ණය<br>02. ගල්කිස්ස අධිකරණ සංකීර්ණය<br>03. නුගේගොඩ අධිකරණ සංකීර්ණය | 01. දරුවන්ගේ අධ්‍යාපන කටයුතු සඳහා සහාය වීම.<br>02. වයෝවෘධ දෙමාපියන් රැක බලාගැනීම.<br>03. ගමනාගමන අපහසුතා සහ ගමන් වියදම් අධික වීම. | | අනුප්‍රාප්තිකයෙකු සහිතව/ රහිතව නිර්දේශ කරමි/ නොකරමි |
| 02. | | | | | | |
| 03. | | | | | | |

ඉහත කරුණු පරීක්ෂා කර බලා නිවැරදිව සකස් කරන ලදී.

ආයතන ලිපිකරුගේ නම සහ අත්සන : ........................
නිවැරදි බවට සහතික කරමි.
රෙජිස්ට්‍රාර්ගේ අත්සන හා නිල මුද්‍රාව:

...........................................................
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන හා
නිල මුද්‍රාව

දිනය: ...............................